# තිරසර සංවර්ධන අරමුණුවලට සමගාමීව
# ශ්‍රී ලංකාවට වඩාත් උචිත ජාතික අධ්‍යාපන වැඩසැලැස්මක්
# සඳහා වූ
# සිවිල් සමාජ සංවිධාන යෝජනා

CED Sri Lanka
Quality Education For All

**අධ්‍යාපන සංවර්ධන සන්ධානය**

## අපගේ දැක්ම

ජාති, ආගම්, කුල, භාෂා, සමාජ සහ ආබාධිත තත්ත්වයන් නොසළකා සියලු දෙනාට ගුණාත්මක හා සමාන අධ්‍යාපන අවස්ථාවන් සහතික කිරීම



## අපගේ මෙහෙවර

සියලුදෙනාටම ගුණාත්මක සහ සමාන අවස්ථා සහිත අධ්‍යාපනයක් සහතික කිරීම සඳහා ජාතික ප්‍රතිපත්ති සකස් කිරීමට සහ ක්‍රියාත්මක කිරීමට බිම්මට්ටමේ සිට ජාතික මට්ටම දක්වා සිවිල් සමාජ සංවිධාන හා පුරවැසි මැදිහත්වීම පිණිස බලපෑම් කිරීම හා දිරිගැන්වීම සහ අධ්‍යාපනික සංවර්ධනය උසස් ම ප්‍රමිතීන්ගෙන් යුතුව ලබා ගැනීමට සිවිල් සමාජය හා පුද්ගලයින් දිරිමත් කිරීම

## අපගේ අරමුණු

1. සැමට ගුණාත්මක හා සම අධ්‍යාපනයකට අවස්ථාවන් සළසන ජාතික හා පළාත් අධ්‍යාපන ප්‍රතිපත්තීන් සිවිල් සමාජ සංවිධානයන්ගේ දායකත්වය ගෙන ඒමට හා ක්‍රියාත්මක කිරීමට බලපෑම් කිරීම සහ එය ප්‍රවර්ධනය කිරීම

2. හැකි උපරිම මට්ටමින් ජාතික අවශ්‍යතා සහ ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූලව වන අයුරින් අධ්‍යාපනය සාක්ෂාත් කර ගැනීම සඳහා අධ්‍යාපන ප්‍රතිපත්ති, ප්‍රතිසංස්කරණ සහ සැළසුම් සකස් කිරීමට හා ක්‍රියාත්මක කිරීමට බලපෑම් හා පෙළඹවීම් කිරීම

3. කිසිවෙකුත් මගනොහැරෙන ආකාරයෙන් සහ සියලු පාර්ශවකරුවන්ගේ සහභාගීත්වය අන්තර්ගත වන පරිදි අධ්‍යාපන සංවර්ධන ක්‍රියාකාරකම් ප්‍රවර්ධනය පිණිස සියලු මට්ටම්වල සිවිල් සංවිධාන කණ්ඩායම්වල සහ ජාලයන්ගේ කුසලතාවන් ශක්තිමත් කිරීම

4. ගුණාත්මක සහ සාධාරණ අධ්‍යාපනයක් සහතික කිරීම උදෙසා අධ්‍යාපන ප්‍රතිපත්ති, සැලසුම් සහ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම, නිරීක්ෂණය කිරීම සහ නිර්දේශ සිදු කිරීම

CED Sri Lanka
Quality Education For All





## අධ්‍යාපන සංවර්ධන සන්ධානය

අධ්‍යාපන සංවර්ධන සන්ධානය යනු සියළු දෙනාටම ගුණාත්මක සහ සමාන අවස්ථා සහිත අධ්‍යාපනයක් ලබාදීම සහතික කිරීම සඳහා කැපවී ක්‍රියාකරන සිවිල් සමාජ සංවිධාන එකතුවකි. ශ්‍රී ලංකාවේ අධ්‍යාපනයේ උන්නතියට මෙන්ම ගෝලීය ඉලක්ක අනුව සහ දේශීය අවශ්‍යතා අනුව අධ්‍යාපනය දියුණු කිරීමට දායකත්වය ලබාදීමට අප සන්ධානය කටයුතු කරනු ලබයි.

අධ්‍යාපන ඇමතිවරුන් විද්වතුන් හා නිලධාරීන්ද සහභාගීවූ 2015 ගෝලීය අධ්‍යාපන සංසදයේ ප්‍රකාශනය (Incheon) පරිදි වසර 2030 දී සැමට යාවජීව අධ්‍යාපන අවස්ථා ප්‍රවර්ධනය කරමින් අන්තර්කරණ සහ සම අවස්ථා සහිත ගුණාත්මක අධ්‍යාපනයක් තහවුරු කිරීම නම් වූ තිරසාර සංවර්ධන ඉලක්කයන් හි 4 අරමුණ සාක්ෂාත් කර ගැනීමට සිවිල් සමාජීය දායකත්වය සක්‍රියව ලබාදීම අපගේ අරමුණයි.

ඒ සමගින්ම අධ්‍යාපනය සම්බන්ධ මෙම ජාතික ඉලක්ක සපුරා ගැනීම සඳහා ශ්‍රී ලංකා රජයේ විශේෂයෙන්ම අධ්‍යාපන අමාත්‍යාංශයේ ප්‍රධානත්වයෙන් ගනු ලබන ක්‍රියාමාර්ග වලට සහාය ලබාදීමට අපි අපේක්ෂා කරමු. මෙහිදී සිවිල් සමාජීය සංවිධාන සහ රාජ්‍ය අංශය ඒකාබද්ධව ක්‍රියා කිරීම තුළින් වඩාත් ඵලදායීව සහ කාර්යක්ෂමව මෙම අරමුණ දිනාගැනීමට හැකිවනු ඇතැයි අපි තරයේ විශ්වාස කරමු.

අධ්‍යාපන සංවර්ධන සන්ධානය
අංක 439/6A
සුදර්ශන මාවත
තාවල පාර
රාජගිරිය

දුරකතන අංක 0112887642 ඊ මේල් cedsrilanka@yahoo.com
අන්තර්ජාලය www.cedsrilanka.net

CED Sri Lanka
Quality Education For All



# තිරසර සංවර්ධන අරමුණුවලට සමගාමීව ශ්‍රී ලංකාවට වඩාත් උචිත ජාතික අධ්‍යාපන වැඩසැලැස්මක් සඳහා වූ සිවිල් සමාජයීය යෝජනා

**හැඳින්වීම**

ශ්‍රී ලංකාවේ අධ්‍යාපන ක්‍රියාවලිය ජාතික සංවර්ධනයට සහ ජාත්‍යන්තර සම්මුතීන් ට අනුකූලව තිරසර සංවර්ධන ක්‍රියාදාමයටත් පෞද්ගලික සහ සාමූහික සන්තෘප්තියටත් දායක වන ආකාරයට සකසා ගැනීම පිණිස අධ්‍යාපන සංවර්ධන සන්ධානයේ සාමාජික සිවිල් සංවිධාන නියෝජිතයින් 35 දෙනෙක් සමග සංවාදයක් ගොඩනගමින් සකස් කරන ලද යෝජනා මෙයින් ඉදිරිපත් කරමු. මෙම යෝජනා සැකසීමේදී පිළිගත් අධ්‍යාපනඥයන්ගේ සහාය ලබාගන්නා ලදි.

**ක්‍රමවේදය**

2030 වසරේ දී ලගාකර ගැනීමට අපේක්ෂිත තිරසර සංවර්ධන අරමුණු අතරින් අධ්‍යාපන අරමුණ සාක්ෂාත් කර ගැනීම උදෙසා හා ශ්‍රී ලංකාව ට උචිත ජාතික අධ්‍යාපන වැඩසැලැස්මක් සැකසීමේදී සැළකිල්ලට ගත යුතු කරුණු පිළිබඳව සංවාදාත්මක වැඩමුලු කිහිපයක් පවත්වන ලදී. එම වැඩමුලුවල කණ්ඩායම් ක්‍රියාකාරකම් සහ සැසිවාරවල සාකච්ඡා වූ අදහස් හා යෝජනා කරුණු 60 ක් පමණ සංඛ්‍යාවක් පාදක කරගෙන මෙම යෝජනා සකස් කර තිබේ. එම යෝජනා මාතෘකා / තේමා 10 ක් යටතේ සාරාංශගත කර පහත දක්වා ඇත.

## යෝජනාවලිය

**යෝජනා - 1.**

**සංදර්භය**

ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සහ අධ්‍යාපනය සම්බන්ධ ජාත්‍යන්තර සම්මුති, අධ්‍යාපන පද්ධතියේ විකාශයේ යහභාවිතයන්, මෙතෙක් බලපවත්වා ඇති අධ්‍යාපන අණපනත්, රෙගුලාසි ආදිය ගැනද සැලකිලිමත් වෙමින් අධ්‍යාපන මූලධර්මවලට පටහැනි නොවන ලෙස මූලික අධ්‍යාපනය ප්‍රතිපත්තියක් පිළිබඳව ජාතික ඒකගතාවයකට එළඹිය යුතුය.



**යෝජනා - 2.**

**දර්ශනය**

දැනට පවතින විෂයමූලික බුද්ධිඵලය කේන්ද්‍ර කරගත් පාඨමාලා, ඉගැන්වීම් ක්‍රම සහ ඇගයීම් ක්‍රම සංශෝධනය විය යුතුය. සමාජ ආකල්පවල ප්‍රගතිශීලි වෙනස්කම් වලට මූලිකත්වය ලබාදිය හැකි සමාජ හා පරිසර හිතකාමී ජීවන නිපුණතා වලින් හෙබි අනාගත පුරවැසියන් නිර්මාණය කිරීම සඳහා විචාරශීලි බව, සංවේදීතාව, ගැටලු විසඳීම, විශ්ලේෂණය, ආරම්භකත්වය, සාමූහිකත්වය, විනයගරුක බව වැනි චිත්තවේගී ඉගෙනුම් ඵලයට වැඩිබරක් ගෙන දෙන ගුණාංග ගොඩනැංවීමට අධ්‍යාපන ක්‍රියාවලියේදී මූලික වශයෙන් අවධානය යොමුවිය යුතුය.

**යෝජනා - 3.**

**පාර්ශවකරණය**

අධ්‍යාපන ප්‍රතිසංස්කරණ හඳුන්වාදීම සියලුම මට්ටම් වල පාර්ශවකරුවන් සමග සහභාගිත්ව ක්‍රමවේදයක් අනුගමනය කරමින් සිදුකළ යුතුවේ මෙහිදී පාර්ශවකරුවන් ලෙසට ප්‍රතිපත්ති සම්පාදකයින්, අධ්‍යාපන බලධාරීන් හා ක්‍රියාකාරකයින්, ගුරුවරුන් , සිවිල් සංවිධාන නියෝජිතයින්, ආගමික නායකයින්, සෞඛ්‍ය හා ක්‍රීඩා ක්ෂේත්‍රයේ නියෝජිතයින්, ව්‍යවසායකයින් මෙන්ම දෙගුරුන් හා ශිෂ්‍යයින් හැඳින්විය හැකිය. මෙම ප්‍රතිසංස්කරණ වලින් අපේක්ෂිත වෙනස්කම් කරා ළඟාවන්නේද යන්න නිරීක්ෂණය කිරීම සඳහා මග සළකුණු පිහිටුවා, අඛණ්ඩව සමාලෝචනය කිරීම හා නිවැරදි කිරීම් සමාන්තරගතව සිදුවිය යුතුය. මෙහිදී ගනු ලබන තීරණ සම්බන්ධයෙන් මාධ්‍ය හරහා ජනතාව පුලුල් ලෙස දැනුම්වත් කිරීමක් සිදුකළ යුතුය.

**යෝජනා - 4.**

**අධ්‍යාපන අයිතිවාසිකම්**

තිරසර සංවර්ධන අරමුණු අංක 4 අධ්‍යාපන අරමුණ අනුව 2030 වසර වනවිට සියලුදෙනාම අන්තර්කරණයවූ ගුණාත්මක අධ්‍යාපනයක් ලබාගැනීමත් අඛණ්ඩ ඉගෙනීම් අවස්ථා තහවුරු කිරීමටත් අපේක්ෂා කරනු ලබයි මෙම අරමුණ දිනා ගැනීම සඳහා අයිතිවාසිකම් ලබාදෙන රාජ්‍ය යාන්ත්‍රණයේ වගකීම් දරන්නන් මෙන්ම අයිතිවාසිකම් වල ප්‍රතිලාභීනයින් වන ළමුන් සහ දෙමාපියන්ද ක්‍රියාකාරීව සම්බන්ධ කරගැනීමට ප්‍රමාණවත් අවධානයක් යොමුකළ යුතුවේ අනෙකුත් තිරසර සංවර්ධන අරමුණු දිනාගැනීමේදී අධ්‍යාපනය මගින් ලබාදිය හැකි සුවිශේෂී දායකත්වය සැලකිල්ලට ගනිමින් ඒ සඳහා විධිමත් මැදිහත්වීම් හා ක්‍රියාකාරකම් සැකසිය යුතුය. අධ්‍යාපන පද්ධතියට ළමා අයිතිවාසිකම් හා යුතුකම් සුරැකීමේ විධිවිධාන ඇතුළත් කළ යුතු අතර අයිතිවාසිකම් දිනාගැනීමේදී ඇතිවන්නා වූ බාධක සමනය කරලීමට සිවිල් සමාජ මැදිහත්වීම් ප්‍රවර්ධනය කළ යුතුවේ.



**යෝජනා - 5.**

**අධ්‍යාපන කළමණාකරණය –**

අවශ්‍යතාවයන් තක්සේරු කිරීමෙන් අනතුරුව අධ්‍යාපනය සඳහා වූ සම්පත් සැපයීම කිසිදු භේදයකින් තොරව සාධාරණ අයුරින් සිදුවන බවට මධ්‍යම රජය වගබලාගත යුතු අතර ගුණාත්මක සැපයුම්, සම්පත් සහ ගුරුවරුන් අදාළ ප්‍රජාවට අනුරූපිතව වඩාත් තාර්කික අන්දමින් ලබාදීම උදෙසා ඒවා සම්පාදනය හා බෙදාහැරීමේ ක්‍රියාවලිය විමධ්‍යගත කළ යුතුය. ජාතික සැලසුම් සකස් කිරීම සහ ඇගයීම මධ්‍යම රජය විසින් සිදු කළ යුතුය. දේශපාලන ආගම්, භාෂා, ප්‍රදේශ ආදී බාහිර බලපෑම් වලින් නිදහස් වී පාසල දීප්තිමත් ස්වාධීන ආයතනයන් කරා දියුණු කිරීමට මග සැලැස්විය යුතුය.

**යෝජනා - 6.1**

**ගුරුවරුන් හා අධ්‍යාපන කාර්ය මණ්ඩල**

සෑම අධ්‍යාපන ආයතනයකටම ගුණාත්මකභාවයෙන් උසස් කාර්යය මණ්ඩලයක් ලබාදීමටත් ඔවුන්ට අදාළ පුහුණු ලබාදීම අධ්‍යාපන අධිකාරියේ මාර්ගෝපදේශකත්වය ඇතිව අධ්‍යාපන අංශයේ නියෝජිතයින්ගේ සැදුම් ලත් අධිකාරියක අධීක්ෂණය යටතේ සිදුවිය යුතුයි

පාසල් , උසස් අධ්‍යාපන ආයතන හා බාහිර ආයතන සමග සම්බන්ධීකරණයෙන් යුතුව අධ්‍යාපන කාර්ය මණ්ඩල මෙන්ම පාසල් ආශ්‍රිත ප්‍රජාවේ ද මානව සම්පත් සංවර්ධනය සඳහා වැඩසටහන් ගොඩනැගිය යුතුයි නවෝත්පාදන ව්‍යවහාරයන්ටද ඉඩසලසමින් රාජ්‍ය හා පෞද්ගලික අංශයේ විශේෂඥදැනුම මේ සඳහා උපයෝගී කරගත හැකියි

අධ්‍යාපන ක්ෂේත්‍රයේ කාර්යය මණ්ඩල, වෘත්තීය සමිති, උසස් අධ්‍යාපන ආයතන, රාජ්‍ය පෞද්ගලික සහ ජාත්‍යන්තර ආයතන සමග සහයෝගයෙන් නිපුණතා සංවර්ධනයට වැඩසටහන් ක්‍රියාත්මක කළ යුතු ය. අඛණ්ඩ සහ යාවජීව ඉගෙනුම් මධ්‍යස්ථාන ලෙස පාසලේ කාර්යභාරය ව්‍යාප්ත කිරීම, ස්ථාන මාරු, උසස් වීම් හා ගුරුවරුන් හා කාර්ය මණ්ඩලය අතිරේක කාර්ය යෙදවීම බලපෑම් වලින් තොර ස්වයං තීරණ බලතල සහිත පාසල් කළමණාකරණ මණ්ඩල ස්ථාපිත කර එ මගින් නියාමනය කළ යුතුය.

**යෝජනා - 6.2**

**පාසල්වල හා ආයතනවල කාර්ය පථය**

පෙර පාසල් - පාසල්, පිරිවෙන්, වෘත්තීය පාඨශාලා, තාක්ෂණ විද්‍යායතන, විශ්ව විද්‍යාල, වෘත්තීය සභා යනාදී අධ්‍යාපනය සපයන සියලු ආයතන නිශ්චිත විෂය නිර්දේශ, කාර්ය පාටිපාටි, සාධන හා කළමණාකරන ක්‍රම අනුගමනය කළ යුතු අතර ඒවා එකිනෙක හා සම්බන්ධ විය යුතුය.



ඉගෙනුම් ලබන අයගේ උපරිම යහපත පිණිසද ප්‍රාදේශීය සහ ජාතික අරමුණු අනුවද ජාත්‍යන්තර සම්මුතීන්ට අනුකූලවන අයුරින් පාසල් පාදක අධීක්ෂණ හා ඇගයීම් රටාවක් ගොඩ නගා නිශ්චිත කාල රාමු ඔස්සේ එකී ඇගයීම් ප්‍රමිතිගත කරවා ගැනීමට ජාතික සහ බාහිර පරීක්ෂණ ආයතන එක්ව කටයුතු කිරීම සිදුකළ යුතුයි
මධ්‍යම විෂය මාලාව සහ පොදු විභාග ඉලක්ක කර ඉගැන්වීම මගින් සමබර පෞරුෂ වර්ධනයට ඉවහල් නොවන ක්‍රම වෙනුවට පාසලෙන්ම ඉදිරිපත් කරන ප්‍රවීණතා පරීක්ෂණ මත සමුච්චිත ප්‍රවීණතා දැක්වෙන පැසැල් සහතිකයක් එක් එක් පාසලක සන්නාමය* ලෙස දියුණු කර ගැනීමට අවකාශය තනි තනි පාසල් හෝ කණ්ඩායම් ලෙස සකසා ගත යුතුයි (*උදාහරණ වශයෙන් සියලු විශ්වවිද්‍යාල වලින් වාණිජ වේදී උපාධිය පිරිනමන නමුත් ශ්‍රී ජයවර්ධන පුර විශ්ව විද්‍යාලය මේ සම්බන්ධයෙන් විශේෂත්වය දිනාගෙන ඇති ආකාරය දැක්විය හැකියි)

**යෝජනා - 7 - අන්තර්ගතය සහ විෂය මාලා ක්‍රියාවට නැංවීම**

විෂයය මාලාවන් හා අධ්‍යාපන වැඩසටහන් තෝරා ගැනීමට අවස්ථාව සැලසීම ඉතා සුදුසු ය. ගතානුගතික තනි තනි පාඨ ග්‍රන්ථ වලට දැනුම සීමා නොකර නිදහස් ගවේෂණයට සහ නිදහස් අදහස් වලට යොමුවන ස්වයං අධ්‍යයනය උනන්දු කරවන ඉගෙනීමේ ක්‍රමවේද ගැන යුහුසුළු විය යුතුය. ගුරු කේන්ද්‍රීය ඉගැන්වීමේ ක්‍රම වලට වඩා ශිෂ්‍ය කේන්ද්‍රීය ඉගෙනීමේ ක්‍රමවේද වලට ප්‍රමුඛතාවය ලබාදිය යුතුය. සෑම අධ්‍යාපනලාභියෙකුගේම ශක්‍යතාවට උපරිම සහාය ලබාදෙන ඔවුන්ගේ ලැදියාවට, දක්ෂතාවට ගැලපෙන අනාගත අභිලාශ තහවුරු කර ජය ගැනීමට මාර්ග සලසන නව ප්‍රවේශයන් ලබාදීමට පාසලෙන් ඉඩකඩ සැලසිය යුතුය.

සොබා සම්පන්න මානව හිතවාදී තාර්කික පුද්ගලයන් බිහිකළ හැකි ආකාරයට අධ්‍යාපන ක්‍රමය වෙනස් විය යුතු අතර ඉවසීම, ගුණගරුක බව වැනි භාවාත්මක හැගීම් මෙන්ම බහුභාෂා කෞශල්‍ය, ගවේෂණාත්මක බව, තොරතුරු සන්නිවේදනය හා තාක්ෂණික දැනුම හා විෂය සමගාමී මෙන්ම විෂය පරිබාහිර කුශලතාවයන් ඔප් නැන්වෙන ආකාරයෙන් අධ්‍යාපන වැඩසටහන් සකස්විය යුතුය. පාසලේ එක් එක් මට්ටමට ගැලපෙන පරිදි පරිසරය සහ සම්පත් විචාරවත්ව සැලසුම් කළයුතුය.

අමතර සහාය අවශ්‍ය ළමුන්ට අතිරේක ඉගෙනුම් වැඩසටහන් බහුලව සහ අඛණ්ඩව පාසල් තුළ පැවැත්විය යුතුය. මුදල් ඉපයීමේ පරමාර්ථයෙන් අතිරේක පන්ති පැවැත්වීම අකර්මණ්‍ය කළ යුතුය.

**යෝජනා - 8.**

**සම්පත් මධ්‍යස්ථානයක් ලෙස පාසලේ උපයෝගීතාවය**

ගුරු, ශිෂ්‍ය, ආදි ශිෂ්‍ය, දෙගුරු ප්‍රජාව ඇතුළු සියලු කණ්ඩායම්වලට උපරිම ඵලයක් ඇතිවන පරිදි තොරතුරු සහ ශාස්ත්‍රීය දැනුම මෙන්ම හැකියා හඹා යාමට, අත්හදා බැලීමට සහ ප්‍රදර්ශනය කිරීමට සුදුසු ඉගෙනුම් විද්‍යාගාරයක් ලෙස සෑම පාසලක්ම ගොඩ නැඟිය යුතුය. අදාළ ප්‍රජාවේ පුස්තකාලය, ප්‍රජා ශාලාව, තොරතුරු මධ්‍යස්ථානය කාර්මිකාර්මික හා කාර්මික නිපුණතා පුහුණු වැඩසටහන් මෙන්ම, සෞන්දර්ය නිකේතනය ආදී විවිධ සේවාවන් සපයන සම්පත් මධ්‍යස්ථානයක් ලෙසද පාසල සංවර්ධනය කළ යුතුවේ

**යෝජනා - 9.**

**ආයතනික සම්බන්ධතාවයන් විධිමත් කිරීම**

1 අධ්‍යාපන කාර්ය හා අවස්ථා සැලසීම රජයේ ප්‍රධාන වගකීමක් වුවත් එය රජයට පමණක් සීමාවූවක් නොවේ. මේ සඳහා රජයේ ආයතන සහ බාහිර වැඩසටහන් රාශියක් පවතී. රටේ සංවර්ධනය උදෙසා ඒ සියල්ල සරල හා ක්‍රමවත් භාවයකින් යුක්ත විය යුතුයි. උපතේ සිට ජීවිතාන්තය දක්වා පුද්ගලයෙකුගේ අධ්‍යාපන අවශ්‍යතා ඉටු කරන මෙම ක්‍රියාවලිය සරල ව්‍යුහයක් විය යුතුය.

2 අධ්‍යාපන භාර කැබිනට් අමාත්‍යවරයෙකුගෙන් අධ්‍යාපන කාර්යය සංවිධාන විය යුතුයි. අධ්‍යාපන අමාත්‍යාංශයේ කාර්යය විය යුත්තේ අධ්‍යාපන ප්‍රතිපත්ති සැලසුම් සකස් කිරීමයි. මෙහිදී පළාත් අධ්‍යාපන අමාත්‍යාංශ වල නිර්දේශයන්ද සැලකිල්ලට ගත යුතුවේ. ද්විතීයික ආයතන වලට පැවරිය හැකි සියලුම කාර්යයන් වලින් අමාත්‍යාංශය නිදහස් විය යුතුයි. අමාත්‍යාංශයෙන් අධ්‍යාපන දෙපාර්තමේන්තුව වෙන්කර අධ්‍යක්ෂ ජනරාල් වරයකු යටතට පත් විය යුතුය. සියලු වැඩසටහන් හා ආයතන කටයුතු දෙපාර්තමේන්තුවට පැවරිය යුතුයි.



3 අධ්‍යාපන කටයුතු සම්බන්ධීකරණයට හා නියාමනයට සභාවක් (කවුන්සලයක්) පිහිටුවිය යුතුය. විභාග, ප්‍රකාශන, ජාතික අධ්‍යාපන ආයතනය විද්‍යා පීඨ ආදිය එහි සෘජු නියාමනයට සහ අධීක්ෂණයට යටත් විය යුතුය. මෙය සියලු ආකාරයේ බාහිර බලපෑම් වලින් තොර ස්වාධීන ආයතනයක් වියයුතුයි.

4 පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තු, විභාග, ප්‍රකාශන, පුස්තකාල සේවා, ජාතික අධ්‍යාපන ආයතනය හා විද්‍යාපීඨ වැනි ආයතන දෙපාර්තමේන්තු ලෙස පැවැත්විය යුතුවේ. ශාරීරික අධ්‍යාපන ක්‍රීඩා හා සමාජ සංවර්ධන වැනි අංශයන් සමාන්තරව ඇති කරගත හැකිය.

1 අධ්‍යාපන කාර්යයයේ නියුතු සියලුම ආයතන වැඩසටහන් හා පුද්ගලයින් අඛණ්ඩ සුපරීක්ෂණයට යොමු කිරීම පිණිස පැරණි පාසල් පරීක්ෂක ධුරයට සමාන සුපරීක්ෂණ ධුරාවලියක් පැවැතිය යුතුය. නව පාසල් පිහිටුවීම උසස් කිරීමේ සහ සේවක කාර්යය සාධන ආදිය පරීක්ෂක වාර්තා වලට අනුකූලව අවශ්‍යතා මත පදනම්ව පමණක් කළ යුතුය. මෙහිදී සම්මත විගණන සහ සාධන ප්‍රමිතීන් අනුගමනය කළයුතුයි.

2 කවුන්සලය සහ පරීක්ෂක ක්‍රියාවලිය මගින් ජාත්‍යන්තර හා පෞද්ගලික අංශයේ සියලු පාසල්වල ප්‍රමිතිය හා ශෛතික අවශ්‍යතා ජාතික අධ්‍යාපන වැඩසටහනට අනුකූලව ගුණාත්මකභාවයෙන් ඔිදුවන බවට තහවුරු කළ යුතුය.

3 ගුරුවරුන් ඇතුළු සියලු කාර්ය මණ්ඩල සංවර්ධනය සඳහා අධ්‍යාපන ආයතන හා සම්බන්ධිකරණයන් යුතුව වෘත්තික සභාවක් ඇතිකළ යුතුය.

4 උපදේශන සහ මාර්ගෝපදේශන විශේෂ සභාවක් පිහිටුවා එය කවුන්සලය සමග සම්බන්ධ කළ යුතුවේ.

**යෝජනා 10**



**අනාගත අධ්‍යාපන අභියෝග**

අනාගතයේ අධ්‍යාපන ක්ෂේත්‍රයේ ඇතිවිය හැකි අභියෝග පුරෝකතනය කිරීමටත් නිර්මාණය විය හැකි අවශ්‍යතා හඳුනාගැනීමටත් ඒසඳහා වූ පර්යේෂණ වල නියැලිය යුතුය. අධ්‍යාපන ක්ෂේත්‍රයේ සිදුකරනු ලබන පර්යේෂණ වලින් එළැඹෙන නිගමන ප්‍රකාශයට පත් කිරීමේදී ඒවායේ නිරවද්‍යතාවය පිළිබඳව අමාත්‍යාංශය වගකීමෙන් කටයුතු කළ යුතුය. අන්තර්ජාතික වශයෙන් දැනටමත් සිදුකර ඇති පර්යේෂණ වල නිගමන නිර්දේශයන් මෙහිදී සැලකිල්ල ගත හැකිවේ.

**ජාතික අධ්‍යාපන සැලැස්මක් සැකසීමේදී අධ්‍යාපනයේ හා රටේ සංවර්ධනය වෙනුවෙන් සඳහා වූ මෙම යෝජනා කෙරෙහි ඔබගේ අවධානය යොමුවන අතැයි අධ්‍යාපන සංවර්ධන සන්ධානය අපේක්ෂා කරනු ලබයි.**






**සිවිල් සමාජ යෝජනාවලිය සැකසීම සඳහා උපදේශක දායකත්වය**

ආචාර්ය උපාලි සේදර මහතා
ප්‍රේමසිරි වැලිවිට මහතා
කමල් හේරත් මහතා

**අධ්‍යාපන සංවර්ධන සන්ධානයේ අධ්‍යක්ෂක මණ්ඩලය**

| | |
|---|---|
| K D පීරිස් මහතා | සභාපති |
| W. W වෙල්ලාල මහතා | ලේකම් |
| චමින්ද පියසේකර මහතා | භාණ්ඩාගාරික |
| කමල් හේරත් මහතා | අධ්‍යක්ෂක මණ්ඩල සාමාජික |
| ප්‍රේමසිරි වැලිවිට මහතා | අධ්‍යක්ෂක මණ්ඩල සාමාජික |
| ඇන්ජලා විජේසිංහ මිය | අධ්‍යක්ෂක මණ්ඩල සාමාජික |
| ලූර්දුසාමි මහතා | අධ්‍යක්ෂක මණ්ඩල සාමාජික |
| සුභද්‍රා රාජසිංහ මිය | අධ්‍යක්ෂක මණ්ඩල සාමාජික |
| M. A. C උවයිස් මහතා | අධ්‍යක්ෂක මණ්ඩල සාමාජික |

අධ්‍යාපනික දෘශ්‍ය පරිකල්පනය
**යූබට් දන්වත්ත ලියනගේ**

© ඡායාරූප-
**ජාතික මාධ්‍යරූප අධ්‍යයන හා සංස්කෘතික කේන්ද්‍රය**